ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு

**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date. 2025.09.22 |

| | | |
|---|---|---|
| පැමිණිලිකාර පාර්ශවය | : | එච්.ජේ.අයි. ප්‍රනාන්දු මයා,<br>නො. 382/3, ශ්‍යාමලී,<br>නන්දන මාවත,<br>හුනුපිටිය,<br>වත්තල. |
| වගඋත්තරකාර පාර්ශවය | 01 | මානව සම්පත් කළමණාකරු,<br>ලංකා විදුලිබල මණ්ඩලය,<br>50, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,<br>කොළඹ 02. |
| | 02 | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී,<br>ලංකා විදුලිබල මණ්ඩලය,<br>50, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,<br>කොළඹ 02. |

**පැමිණිලි අංකය : එච්ආර්සී/332/25**

**පැමිණිල්ල**

උක්ත පැමිණිලිකරු විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය විසින් 2016.04.01 දින පල කරන ලද කළමණාකරු ( විමර්ශන) තනතුර සඳහා අභ්‍යන්තර දැන්වීමක් පල කරන ලද බවත් එකී දැන්වීම අනුව එම තනතුර සඳහා අභ්‍යන්තර අයදුම්කරුවෙක්ට අදාල මණ්ඩලීය අනුමත සුදුසුකම වූයේ;

> "To advertise the post of Manager (Investigation) internally within the K3 officer attached to the Accounts & Audit Services who are confirmed in the post with minimum of 7 years experience in the field of Audit & Investigation"

ඉහත සුදුසුකම පදනම් කරගෙන අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඒ සඳහා පවත්වන ලද සම්මුඛ පරික්ෂණයේදී ඔහු එම තනතුර සඳහා තේරී පත්වූ නමුත් ඔහු වෙත ලබා දෙන ලද 2016.07.08 දිනැති පත්වීම් ලිපිය අනුව ඔහුට හිමි වැටුප් තලය ලෙස සඳහන් කර ඇත්තේ K 3 වැටුප් තලය බවයි. කෙසේ වෙතත්

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office : අංක. 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு - 04. / No. 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairman : 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax : 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail : sechrcsl@gmail.com
දුරකථන
ලේකම්
ක්ෂණික
වෙබ්

ආයතනයේ එවකට පැවති 2002 වර්ෂයේ බඳවා ගැනීම් හා උසස් කිරීම් පටිපාටිය අනුව කළමණාකරු (විමර්ශන) යන තනතුර K 2 වැටුප් තලයට සහ 2 පන්තියේ 1 ශ්‍රේණියට අයත් බවත් එකී පටිපාටියට පටහැනි ලෙස ඔහු වෙත ඉහත කී පත්වීම් ලිපිය නිකුත් කර තිබූ බවත් මේ පිළිබඳව ආයතනයට අවස්ථා කිහිපයකදී දැනුම්දීමක් සිදු කරන ලද නමුත් අද වනතුරු එකී ශ්‍රේණිය නිවැරදි කර නොමැති බවත් වැඩිදුරටත් දන්වා ඇත.

2016 වර්ෂයේදී ඉහත පත්වීම ලබා ගැනීමෙන් අනතුරුව ඔහු විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලීම් කිහිපයක් සළකා බැලීමෙන් අනතුරුව පත්වීම් ලද දින සිට බලපැවැත්වෙන පරිදි ඔහුගේ වැටුප් තලය K 2 වැටුප් තලයේ පිහිටුවා ඇති බවත් ආයතනය විසින් ඉහත තනතුර සඳහා පදනම් කර ගන්නා ලද අභ්‍යන්තර දැන්වීමේ K 3 වැටුප් තලය ලෙස සඳහන් කර ඇති කරුණු ආයතනයේ බඳවා ගැනීම් හා උසස් කිරීමේ පටිපාටියට පටහැනි බවට එම අවස්ථාවේදී ඔහු දැනුවත්ව සිටි නමුත් එකී කාරණාව අභියෝගයට ලක් කිරීමට හැකියාවක් නොතිබූ බවත් ඊට හේතුව ලෙස සඳහන් කර ඇත්තේ 2003 වර්ෂයේදී වරදකට ඒ වනවිටත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පිරිස් ) වශයෙන් සේවය කරමින් සිටි නිලධාරියාගේ බරපතල විෂමාචාරයක් සම්බන්ධව මෙම පැමිණිලිකරු විසින් මූලික විමර්ශනයක් සිදු කර එම නිලධාරියාට එරෙහිව විනය පරීක්ෂණයේදී මෙම පැමිණිලිකරු සාක්ෂි දීමෙන් එම නිලධාරියා වරදකරු කර තිබීමේ ප්‍රතිඵලය ලෙස එම නිලධාරියා මෙම පැමිණිලිකරු සමග ඇඩි වෛරයකින් පසුව සිටි බැවින් බවත් ය.

2016 වර්ෂයේ සිදුවූ මෙම ගැටලුව පිළිබඳව 2025 වර්ෂයේදී එනම් අවුරුදු 09 ක් ප්‍රමාද වී මෙම කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට හේතුව ලෙස සඳහන් කර ඇත්තේ මෙම ගැටළුව පිළිබඳව දිගින් දිගටම හිටපු සාමාන්‍යාධිකාරීවරුන් වෙත එක් වතාවක් ලිඛිතව සහ පසුව අවස්ථා කිහිපයකදී වාචිකව ද දන්වා සිටි නමුත් ඒ හැම අවස්ථාවකදීම හිටපු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පිරිස්) විසින් එය නිවැරදි කරන ලෙස වාචිකව පවසා දැනුම්දීමක් කිරීමෙන් අනතුරුව සාමාන්‍යාධිකාරීවරයා ඉහත සඳහන් 2002 වර්ෂයේ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය අධ්‍යයනය කර ඊට අනුකූලව මෙම පැමිණිලිකරුගේ පත්වීම් ලිපිය නිවැරදි කරන ලෙස වර්තමාන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වෙත 2022 වර්ෂයේදී ලිඛිතව දන්වා ඇති නමුත් ඒ සඳහා ද වගඋත්තරකාර ආයතනය විසින් ක්‍රියාත්මක නොවීම මත මෙම කොමිෂන් සභාව වෙත 2025 වර්ෂයේදී පැමිණිල්ලක් ඉදිරිපත් කල බවට කරුණු ඉදිරිපත් කර ඇත.

2022.01.05 දින මේ පිළිබඳව එවකට සිටි ලංවිම සාමාන්‍යාධිකාරී වෙත ලිඛිතව කරුණු ඉදිරිපත් කිරීම මත එකී සාමාන්‍යාධිකාරීවරයා විසින් සියලු කරුණු අධ්‍යයනය කිරීමෙන් පසු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පිරිස්) වෙත ලංවිමට අදාළ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුව පැමිණිලිකරු වෙත ලබාදී ඇති පත්වීම් ලිපිය නිවැරදි කරන ලෙසට උපදෙස් ලබාදීමෙන් අනතුරුව එකී නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයා විසින් මේ පිළිබඳව ප්‍රධාන ඉංජිනේරු වෙතින් හා මානව සම්පත් කළමනාකරු වෙතින් වාර්තා දෙකක් කැඳවා තිබුණු බවට වැඩිදුරටත් දන්වා ඇත.

එහිදී ප්‍රධාන ඉංජිනේරු (ප්‍රතිපත්ති) විසින් 2022.02.24 දිනැතිව ඉදිරිපත් කර ඇති වාර්තාවේ නිර්දේශ කර ඇත්තේ කළමනාකරු (විමර්ශන) තනතුරට අදාළ අනුමත සුදුසුකම 2008.03.31 දිනැති මණ්ඩලීය පත්‍රිකාවේ සඳහන් මණ්ඩලීය අනුමැතිය ඇති සුදුසුකම් බව තවදුරටත් තහවුරු කරමින් මෙම පැමිණිලිකරු කළමනාකරු (විමර්ශන) තනතුරට තෝරා ගෙන ඇත්තේ එකී සුදුසුකමට අනුව නම් අදාළ දින සිට K2/S2 වැටුප් පරිමානය ලබා දෙන ලෙසය. එසේම මානව සම්පත් කළමනාකරු වෙතින්ද කැඳවන ලද 2022-01-10 දිනැති වාර්තාවේදී ද සඳහන් වී ඇත්තේ “If Mr. H.J.I Fernando has been granted the Manager (Investigation) Post, he would have been given S2/K2 (Cl II Gr I) salary scale from the appointment date” යනුවෙනි. ඒ අනුව මානව සම්පත් කළමණාකරු හා ප්‍රධාන ඉංජිනේරු ප්‍රතිපත්ති විසින් පැමිණිලිකරුගේ පත්වීම නිවැරදි කිරීමට අදාළ නිර්දේශයක් ලබාදී තිබියදී මාස 08 කට ආසන්න කාලයක් වන තෙක් එකී උපදෙස් පරිදි කටයුතු නොකළ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පිරිස්) විසින් 2022.09.08 දිනැති ලිපිය මගින් පැමිණිලිකරු වෙත දැනුම් දෙන ලද්දේ ලංවිම බඳවා ගැනීම හා උසස් කිරීමේ පටිපාටිය හා

සම්ප්‍රදායට අනුව (General Practice) පැමිණිලිකරු වෙත කළමනාකරු විමර්ශන තනතුර 11 පන්තිය 1 ශ්‍රේණිය ලබා දිය නොහැකි නමුත් එකී තනතුර 11 පන්තිය 11 ශ්‍රේණියේ K2/S2 වැටුප් පරිමානයට නිවැරදි කරන බවයි. කෙසේ නමුත් ඉහත කී බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ 11 පන්තියේ 11 ශ්‍රේණියේ K 2 වැටුප් පරිමානයට අදාළ කළමනාකරු විමර්ශන තනතුර නොමැති බැවින් මණ්ඩලීය අනුමැතියක් නොමැතිව එවැනි තනතුරක් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පිරිස්) හට අලුතින් හඳුන්වා දීමට නොහැකි බවට වැඩිදුරටත් කරුණු ඉදිරිපත් කර ඇත.

ඉහත කී පටිපාටියට පටහැනි ලෙස කටයුතු කිරීම පිළිබඳව මෙම පැමිණිලිකරු විසින් 2022.11.11 දිනැතිව එවකට සිටි සාමාන්‍යාධිකාරී වෙත අභියාචනයක් ඉදිරිපත් කළ නමුත් එකී සාමාන්‍යාධිකාරීවරයා විසින් වාචිකව පැමිණිලිකරු වෙත දැනුම් දුන්නේ අදාළ පන්තිය හා ශ්‍රේණිය ලබාදීම සම්බන්ධයෙන් බොහෝ විධායක නිලධාරීන් අකමැති බවයි. මේ තුළින්ද පැහැදිලි වන්නේ නිලධාරීන්ගේ කැමැත්ත අකමැත්ත මත කටයුතු කිරීමට ආයතනය එළඹී ඇති බවයි.

පැමිණිලිකරු විසින් වැඩිදුරටත් දන්වා ඇත්තේ ඉහත කී 2002 වර්ෂයට අදාළ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියට අනුව මණ්ඩලය තුළ 11 පන්තිය 1 ශ්‍රේණියට උසස්වීම් ලබා දෙන්නේ පූර්ණ වෘත්තීය සුදුසුකම් සහිත නිලධාරීන්ට පමණක් බැවින් මෙම පැමිණිලිකරුට එකී පන්තිය හා ශ්‍රේණිය ලබා දිය නොහැකි බවට පැමිණිලිකරුට දන්වා සිටීමෙන් පසු එකී පැමිණිලිකරු විසින් සේවක දුක්ගැනවිලි නිරාකරණය කිරීමේ කමිටුව වෙත කරන ලද පැමිණිල්ලට අදාළව එකී කමිටුව විසින් දන්වා තිබුණු කරුණු සත්‍ය බවට පිළිගන්නා බවත් ඉහත කී පටිපාටියට අනුව උසස්වීම ලබා දෙන්නේ නම් එකී මූලික අවශ්‍යතාවය සම්පූර්ණ කර තිබිය යුතු ය. කෙසේ නමුත් මෙම පැමිණිලිකරු වෙත කළමනාකරු (විමර්ශන) තනතුරට ලබා දෙන ලද්දේ උසස්වීමක් නොව අභ්‍යන්තර විගණකවරයෙකු ලෙස කටයුතු කළ පැමිණිලිකරු කළමනාකරු (විමර්ශන) තනතුර පැවති පුරප්පාඩුව සඳහා අයදුම්පත් යොමු කිරීමෙන් පසු එකී තනතුරට කරන ලද පත් කිරීමක් බවත් සඳහන් කර ඇත.

තවද මණ්ඩල තීරණ හා 2002 බඳවා ගැනීම් හා උසස් කිරීමේ පටිපාටිය අනුව 2016.08.26 දින සිට මෙම පැමිණිලිකරු වෙත 11 පන්තිය 1 ශ්‍රේණිය ලබාදී තිබුනේ නම් එම පන්තියේ හා එම ශ්‍රේණියේ සිටින අනෙකුත් නිලධාරීන්ට වසර 6 ක සේවා කාලයෙන් පසුව 2022 අගෝස්තු 26 දින ලැබෙන 1 පන්තිය ලැබීමටද මෙම පැමිනිලිකරුට නීත්‍යානුකූල අපේක්ෂාවක් තිබුණු බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත.

තවද පැමිණිලිකරු අයත් වන උපකාරක ශ්‍රේණියේම 11 පන්තියේ 11 වන ශ්‍රේණියේ නීති නිලධාරීන්ට මණ්ඩලීය අනුමැතියක් නොමැතිව සාමාන්‍යාධිකාරීගේ අනුමැතියෙන් වසර 4 ක සේවා කාලය පදනම් කරගෙන 11 පන්තියේ 1 ශ්‍රේණිය සහ පූර්ණ වෘත්තීය සුදුසුකම් දීමනාවක් ලබා දෙන බැවින් මණ්ඩලයේ අනුමත 11 පන්තියේ 1 ශ්‍රේණියේ කළමණාකරු (විමර්ශන) තනතුරටද විමර්ශන ක්ෂේත්‍රයේ වසර 4 ක සේවා කාලය පදනම් කරගෙන සාමාන්‍යාධිකාරීගෙන් අනුමැතියක් ලබා ගෙන වෘත්තීය සුදුසුකම් දීමනාව මෙම පැමිණිලිකරු හට ලබාදීමට කටයුතු කරන ලෙසත් පැමිණිලිකරු විසින් ඉල්ලා ඇත.

**වගඋත්තරකරුගේ කරුණු දැක්වීම**

මෙම පැමිණිල්ලට අදාළව පවත්වන ලද පරීක්ෂණයේදී වගඋත්තරකරු විසින් මෙම කොමිෂන් සභාවට දන්වා ඇත්තේ මෙම පැමිණිලිකරු වෙත කළමණාකරු (විමර්ශන) තනතුර සඳහා ලබාදී ඇත්තේ බඳවා ගැනීමකට අදාළව පත්වීමක් බවත් උසස්වීමක් නොවන බවත් ආයතනය තුළ පවතින ඉහත කී පටිපාටිය අනුව එම තනතුර අයත් වන්නේ K 2 වැටුප් පරිමානයේ 2 පන්තිය 1 ශ්‍රේණියට බවත් 2016 වර්ෂයේදී එකී තනතුර සඳහා බඳවා ගැනීමට අදාළ පල කරන ලද අභ්‍යන්තර දැන්වීම දෝෂයක් පවතින බවත්, ඉහත සඳහන් කළමණාකරු (විමර්ශන) තනතුර සඳහා අයදුම්කරුවන් හට තිබිය යුතු සුදුසුකම් වන්නේ ගිණුම් හා විගණන සේවයට අනුයුක්තව K 3 වැටුප් තලයේ සේවය ස්ථිර වූ අවම වසර 7 ක විගණන හා විමර්ශන ක්ෂේත්‍රයේ

පළපුරුද්ද ඇති ලංවිම නිලධාරියෙක් වියයුතු බවත් ඊට අමතරව අධ්‍යාපන හෝ වෘත්තීය සුදුසුකම් සළකා බලන ලෙසට කිසිදු විධිවිධානයක් නොමැති බවත් ය.

වගඋත්තරකාර පාර්ශවය විසින් ඉහත පැමිණිල්ලට අදාලව මෙම කොමිෂන් සභාවට ගොනු නර ඇති වාර්තාවේ සඳහන් කර ඇත්තේ කළමණාකරු (විමර්ශන) තනතුර සඳහා 2016.04.01 දින පල කරන ලද අභ්‍යන්තර දැන්වීමට අනුව පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයෙන් අනතුරුව මෙම පැමිණිලිකරු වන එච්.ජේ.අයි. ප්‍රනාන්දු මහතා එකී තනතුර සඳහා තෝරා පත් කර ගන්නා ලද බවත් එවකට පල කරන ලද දැන්වීමට අනුව මෙම පැමිණිලිකරු උක්ත තනතුර සඳහා K 3 වැටුප් තලයේ පිහිටුවා පත්වීම් ලිපියක් නිකුත් කරන ලද බවත් සඳහන් කර ඇත. තවද ආයතනය තුළ පවතින මණ්ඩලීය අනුමත බඳවා ගැනීම් හා උසස් කිරීම් පටිපාටියට අනුව K 3 වැටුප් තලයේ සිට K 2 වැටුප් තලයට පිහිටුවීම සඳහා ක්‍රම දෙකකි.

01 පූර්ණ වෘත්තීය සුදුසුකම් සම්පූර්ණ කළ නිලධාරීන් K 2 වැටුප් තලයට අයත් 2 පන්තිය 1 ශ්‍රේණියට උසස් කිරීම

02 පූර්ණ වෘත්තීය සුදුසුකම් සම්පූර්ණ නොකළ නිලධාරීන් K 2 වැටුප් තලයට පිහිටුවීම.

ඉහත සඳහන් කළ පරිදි 01 වන ක්‍රමවේදය යටතේ මෙම පැමිණිලිකරු කිනම් හෝ ක්ෂේත්‍රයක පූර්ණ වෘත්තීය සුදුසුකම් සපුරා නොමැති බව පෞද්ගලික ලිපි ගොනුව පරීක්ෂා කිරීමේදී අනාවරණය වූ බැවින් මෙම පැමිණිලිකරු හට 2 පන්තියේ 1 ශ්‍රේණියට උසස් කිරීම මගින් K 2 වැටුප් තලය ලබා දිය නොහැකි බවත් ඉහත කී දෙවන ක්‍රමවේදය අනුව පූර්ණ වෘත්තීය සුදුසුකම් සපුරා නොමැති නිලධාරීන් K 3 වැටුප් පරිමාණයේ අවුරුදු 8 ක සක්‍රිය සේවයක් සහිතව 2 පන්තිය 2 ශ්‍රේණියේ අවුරුදු 12 ක සක්‍රිය සේවාවක් කර තිබීම අවශ්‍ය බැවින් ඒ සම්බන්ධව සළකා බැලීමේදී මෙම පැමිණිලිකරු අභ්‍යන්තර විගණක ලෙස අවුරුදු 12 ක සේවා කාලයක් සම්පූර්ණ කිරීම පදනම් කරගෙන K 2 වැටුප් තලයේ පිහිටුවා ඇති බවට වැඩිදුරටත් සඳහන් කර ඇත.

ඒ අනුව පැමිණිලිකරුගේ ඉල්ලීම සළකා බලා ඉහත කී පටිපාටිය අනුව විකල්ප විසඳුමක් ලෙස සාමාන්‍යාධිකාරිතුමන්ගේ එකගත්වයෙන් මෙම පැමිණිලිකරු උක්ත තනතුර සඳහා පත් කරන ලද දින සිට K 2 වැටුප් තලයේ පිහිටුවා ඇති නමුත් ඉහත කී බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය අනුව කළමණාකරු (විමර්ශන) තනතුර K 2 වැටුප් පරිමානයේ 2 පන්තිය 1 ශ්‍රේණියට අදාළ තනතුරක් බවත් එය ලබාදීම සඳහා කිනම් හෝ ක්ෂේත්‍රයක පූර්ණ වෘත්තීය සුදුසුකම් ලබා තිබීම අත්‍යවශ්‍ය බැවින් එකී 2 පන්තිය 1 ශ්‍රේණිය මෙම පැමිණිලිකරු වෙත ලබාදීමට හැකියාවක් නොමැති බවත් සඳහන් කර ඇත.

උපකාරක සේවයේ තනතුරක් වන නීති නිලධාරි තනතුර සඳහා පූර්ණ වෘත්තීය සුදුසුකම් දීමනාව සාමාන්‍යාධිකාරීවරයාගේ අනුමැතිය සහිතව ලබාදී ඇති බවත් එම ලිපියට අනුව ලංවිම බඳවා ගැනීම් හා උසස් කිරීමේ පටිපාටියට අනුව ජ්‍යෙෂ්ඨ විධායක තනතුරක් වන නීති නිලධාරි තනතුර සඳහා පූර්ණ වෘත්තීය සුදුසුකම් නිර්වචනය කර නොමැති බවත් ශ්‍රී ලංකා නීතිඥ සංගමය විසින් ද නීතිඥවරයෙකු සඳහා වෘත්තීය සුදුසුකම් නිර්වචනය කර නොමැති බවත් තවද IESL හා ICASL වැනි වෘත්තීය සුදුසුකම් ලබා දෙන ආයතන වල නිර්වචනය කර ඇති පරිදි නීති ක්ෂේත්‍රයෙහි වෘත්තීය සාමාජිකත්වය ලබාදීම සඳහා නිශ්චිත ක්‍රමවේදයක් නිර්වචනය කර නොමැති නමුත් ශ්‍රේෂ්ඨාධිකරණය යනු නීතිඥ වෘත්තීය සඳහා ඉහළම සුදුසුකම ලබා දෙන ආයතනයක් බවත් සඳහන් කර ඇත.

කෙසේ නමුත් විමර්ශන කළමණාකරු තනතුර විවෘත තනතුරක් වන අතර එකී තනතුර සඳහා ගණකාධිකාරී ක්ෂේත්‍රයේ / විගණන ක්ෂේත්‍රයේ / නීතිඥ / වෙනත් ක්ෂේත්‍රයක වෘත්තිකයෙකු ලංවිම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය අනුව තෝරා පත් කර ගත හැකි බවත් ඒ අනුව විමර්ශන කළමණාකරු තනතුරෙහි රාජකාරි කිරීම සඳහා සුදුසුකම් සහිත වෘත්තිකයෙකුට දක්ෂතාවය, නිපුණතාවය හා කුසලතාවය පදනම් කරගෙන රාජකාරි කටයුතු සිදු කළ හැකි බැවින් නීතිඥයෙකු වූයේ නම් පමණක් මෙම පැමිණිලිකරු වෙත පූර්ණ වෘත්තීය සුදුසුකම් දීමනාව ලබා දියහැකි බවට වැඩිදුරටත් සඳහන් කර ඇත.

**නිරීක්ෂණ**

ඉහත සඳහන් පැමිණිල්ලේ කරුණු සහ වගඋත්තරකරුවන්ගේ කරුණු සියල්ල සළකා බැලීමේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය වේ.

- පැමිණිලිකරු විසින් මෙම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති ලිඛිත කරුණු සහ ලේඛන සාක්ෂි අනුව 2008.03.31 දිනට මණ්ඩලීය පත්‍රිකාව අනුව කළමණාකරු (විමර්ශන) තනතුර සඳහා සුදුසුකම ලෙස ගිණුම් හා විගණන සේවයට අනුයුක්තව K 3 වැටුප් තලයේ සේවය ස්ථිර වූ අවම වසර 7 ක විගණන හා විමර්ශන ක්ෂේත්‍රයේ පළපුරුද්ද ඇති ලංවිම නිලධාරීන්ගෙන් කළමනාකරු (විමර්ශන) තනතුර සඳහා අයදුම්පත් කැඳවීමට අදාළ අභ්‍යන්තර දැන්වීමක් නිකුත් කිරීමට අවසර ඉල්ලා ඇති බවට නිරීක්ෂණය වේ.

- එකී ඉල්ලීම අනුව 2008.04.03 දිනැති Internal Memo අනුව ඉහත කී ඉල්ලීම සඳහා අනුමැතිය ලබාදී ඇති බවට නිරීක්ෂණය වන අතර එකී තනතුර සඳහා වෙනත් සුදුසුකම් තිබිය යුතු බවට එහි සඳහන්ව නොමැත.

- ඒ අනුව 2008.04.04 දිනැතිව කළමනාකරු (විමර්ශන) තනතුර සඳහා පළ කර ඇති දැන්වීම සළකා බැලීමේදී එහිදී එකී තනතුර සඳහා වූ සුදුසුකම ලෙස සඳහන් කර ඇත්තේ විගණන හා විමර්ශන ක්ෂේත්‍රයට අනුයුක්තව K 3 වැටුප් තලයේ ස්ථිර වූ අවම වසර 7 ක සේවා පළපුරුද්ද තිබිය යුතු බවට සඳහන් වී ඇති බවට නිරීක්ෂණය වේ. ඊට අමතරව වෙනත් සුදුසුකම් එහි සඳහන්ව නොමැත.

- එහෙත් වගඋත්තරකාර පාර්ශවය වන ලංකා විදුලිබල මණ්ඩලයේ 2016 වර්ෂයේදී කළමණාකරු (විමර්ශන) තනතුර සඳහා බඳවා ගැනීමට 2016.04.01 දින අභ්‍යන්තර දැන්වීමක් පළ කර ඇති අතර එකී දැන්වීම අනුව කළමණාකරු (විමර්ශන) තනතුර සඳහා අයදුම්පත් කැඳවන ලෙසට සඳහන් කර ඇත්තේ K 3 වැටුප් තලයේ සේවය ස්ථිර වූ අවම වසර 7 ක විගණන හා විමර්ශන ක්ෂේත්‍රයේ පළපුරුද්ද ඇති ලංවිම නිලධාරීන් අයදුම් කිරීම සඳහා සුදුසුකම් ලබන අතර ඊට අමතරව උපාධියක් හෝ ඒ හා සමාන සුදුසුකමක් තිබිය යුතු බවත් ය. ඊට අදාළ වැටුප් තලය KK 3 ලෙස සඳහන් කර ඇති බවත් නිරීක්ෂණය වන අතර එසේ බඳවා ගැනීමේ පටිපාටිය අනුව එකී තනතුරට අදාළ වැටුප් තලය K II බව නිරීක්ෂණය වේ.

- ඒ අනුව ඉහත පැමිණිලිකරු විසින් උක්ත තනතුර සඳහා 2016.04.28 දිනැතිව Equivalent qualification යටතේ ඉදිරිපත් කර ඇති අතර ඒ සඳහා පැමිණිලිකරු විසින් The Institute of Chartered Accountant of Sri Lanka ආයතනයේ සම්පූර්ණ කරන ලද Certified Business Accountant සහතික පත්‍රයක් ඉදිරිපත් කර ඇති බවට නිරීක්ෂණය වන අතර පැමිණිලිකරු විසින් එසේ ඉදිරිපත් කර ඇති සුදුසුකම්වලට අදාළ සහතික පත්‍ර ඉහත බඳවා ගැනීමට අදාළ චක්‍ර ලේඛයේ සමාන සුදුසුකම් යටතේ එම තනතුර සඳහා සුදුසුකම් ලබා ඇති බැවින් එකී සම්මුඛ පරීක්ෂණය සඳහා මෙම පැමිණිලිකරු කැඳවීම සඳහා ලංවිම ගිණුම් හා සමාන්තර සේවා විධායක නිලධාරීන්ගේ සංගමයේ එවකට සිටි සභාපති විසින් 2016.05.26 දිනැති ලිපිය මගින් සාමාන්‍යාධිකාරී ලංවිම වෙත ඉල්ලීමක් කර ඇති බවට කරුණු අනාවරණය වේ. ඒසේම 2016.05.26 ඒකී ලිපිය මගින් වානිජවේදී උපාධිය හා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අන්තර් මාධ්‍ය සුදුසුකම්

- එකී තනතුර සඳහා පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයෙන් පසුව මෙම පැමිණිලිකරු තේරී පත්වී ඇති අතර 2016.07.08 දිනැතිව මෙම පැමිණිලිකරු වෙත ලබාදී ඇති පත්වීම් ලිපියේ ද මෙම

පැමිණිලිකරු කළමණාකරු (විමර්ශන) තනතුර සඳහා K 3 වැටුප් පරිමානයේ පිහිටුවන බවට සඳහන් කර ඇති අතර, පැමිණිලිකරු විසින් පසුව ඇය නිවැරදි කරන ලෙස කරනු ලැබූ ඉල්ලීම සළකා බලා පැමිණිලිකරුගේ වැටුප් තලය K 2 පරිමාණයේ පත්වීම් ලද දින සිට බලපැවැත්වෙන පරිදි නිවැරදි කර ඇත. එහෙත් පැමිණිලිකරු විසින් ඉල්ලා සිටින K 2 වැටුප් තලයෙන් 11 පන්තිය 1 ශ්‍රේණියේ පිහිටුවා නොමැති බවත් නිරීක්ෂණය වේ.

- මෙම පැමිණිල්ලට අදාළව වගඋත්තරකාර පාර්ශවය විසින් කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇති 2025.03.12 දිනැති වාර්තාවේ සඳහන් කරුණු සළකා බැලීමේදී වගඋත්තරකාර ආයතනය තුළ පවතින 2002 වර්ෂයේ මණ්ඩලීය අනුමත බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය අනුව K 3 වැටුප් තලයේ සිට K 2 වැටුප් තලයේ පිහිටුවීමේදී අනුගමනය කළයුතු ක්‍රමවේදය පිළිබඳව එනම් උසස්වීමක් ලැබීමට අවශ්‍ය මූලික සුදුසුකම් සම්බන්ධව කරුණු දක්වා ඇති බවට නිරීක්ෂණය වේ.

- වගඋත්තරකාර පාර්ශවය විසින් ප්‍රකාශ කරන පරිදි ඉහත කී බඳවා ගැනීමේ උසස් කිරීමේ පටිපාටිය අනුව K 3 වැටුප් තලයේ සිට K 2 වැටුප් පරිමානයේ 11 පන්තිය 1 ශ්‍රේණිය වෙත උසස් කිරීම සඳහා K 3 වැටුප් පරිමානයේ අවුරුදු 5 ක සක්‍රීය සේවයක් සහිතව 11 පන්තිය11 ශ්‍රේණියේ අවුරුදු 9 ක සක්‍රිය සේවාවක් ඇති පූර්ණ වෘත්තීය සුදුසුකම් ලත් නිලධාරියෙකු වියයුතු නමුත් මෙම පැමිණිලිකරු කිනම් හෝ ක්ෂේත්‍රයක පූර්ණ වෘත්තීය සුදුසුකම් සපුරා නොතිබීම හේතුවෙන් එකී K 2 වැටුප් පරිමානයේ 11 පන්තිය 1 ශ්‍රේණියට උසස් කිරීමට හැකියාවක් නොපවතින නමුත් පූර්ණ වෘත්තිය සුදුසුකම් සපුරා නොමැති නිලධාරින් K 3 වැටුප් පරිමාණයේ සක්‍රිය සේවයක් සහිතව II පන්තියේ 11 ශ්‍රේණියේ අවුරුදු 12ක සක්‍රිය සේවාවක් සම්පූර්ණ කර ඇති නිලධාරින් K 2 වැටුප් තලයේ පිහිටුවීමට හැකි බැවින් එය පදනම් කරගෙන මෙම පැමිණිලිකරු ඒ වන විට අභ්‍යන්තර විගණක ලෙස අවුරුදු 12ක සේවා කාලයක් සම්පූර්ණ කිරීම හේතුවෙන් මෙම පැමිණිලිකරු වෙත K 2 වැටුප් තලයේ පිහිටුවීමට කටයුතු කර ඇති බවට නිරීක්ෂණය වේ.

- කෙසේ නමුත් මෙම පැමිණිලිකරු විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති පැමිණිල්ලේ සඳහන් කරුණු වන්නේ කළමණාකරු (විමර්ශන) තනතුර සඳහා උසස් කිරීමේ දී සිදු වූ අයිතිවාසිකම් උල්ලංඝණය වීමක් සම්බන්ධව නොවන අතර එකී තනතුර සඳහා බඳවා ගැනීමේදී සිදුවූ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වීම පිළිබඳව බව වඩා පැහැදිලිය.

- ඒ අනුව උක්ත කරුණු සියල්ල සලකා බැලීමේ දී වගඋත්තරකාර ආයතනය තුළ පවතින 2002 වර්ෂයේ මණ්ඩලිය අනුමත බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය අනුව ඉහත කී කළමණාකරු (විමර්ශන) තනතුර K 2 වැටුප් තලයේ II පන්තිය 1 ශ්‍රේණියට අයත් තනතුරක් බවත් එකී තනතුර සඳහා බඳවා ගැනීමට 2016 වර්ෂයේදී අභ්‍යන්තර දැන්වීම පළ කරන ලද අවස්ථාවේදී ද කළමණාකරු (විමර්ශණ) තනතුර ඉහත සඳහන් වැටුප් තලයේ II පන්තිය 1 ශ්‍රේණියට අයත්ව තිබූ බවට නිරීක්ෂණය වන අතර ඊට අදාළ වන සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ දැන්වීමේ සඳහන් වේ. එකී සුදුසුකම් පැමිණිලිකරු එම අවස්ථාවේ සම්පූර්ණ කර ඇති බව හා පැමිණිලිකරු එම තනතුරට බඳව ගැනීමෙන් වගඋත්තරකාර ආයතනයෙන් එය පිළිගෙන ඇති බව නිරීක්ෂණය වේ.

- එහෙත් ආයතනය තුළ පැවැති මණ්ඩලීය බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියට පටහැනි ලෙස වගඋත්තර පාර්ශවය විසින් එකී තනතුර සඳහා 2016 වර්ෂයේදී බඳවා ගැනීමට කටයුතු කරන අවස්ථාවේදී පළ කරන ලද අභ්‍යන්තර දැන්වීමේ කළමණාකරු (විමර්ශන) තනතුර K 3 වැටුප් තලය අයත් බවට සඳහන් කිරීම, එකී අභ්‍යන්තර දැන්වීම පදනම් කරගෙන එකී තනතුර සඳහා තේරී පත් වූ මෙම පැමිණිලිකරු වෙත ලබා දෙන ලද 2016.07.08 දිනැති පත්වීම් ලිපියේද ඔහුගේ තනතුර K 3 වැටුප් තලයට අයත් බවට සඳහන් කිරීම සහ ඒ අනුව කටයුතු කිරීම අවිධිමත් ක්‍රියාවලියක් බවට නිරීක්ෂණය වන අතර එවැනි ක්‍රියාවලිය හේතුවෙන් පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වී ඇති බවට අනාවරණය වේ.

- පැමිණිලිකරු විසින් ඉදිරිපත් කර ඇති කරුණු වැඩිදුරටත් සළකා බැලීමේදී මෙම පැමිණිලිකරු විසින් 2022.01.05 දින එවකට සිටි ලංවිම සාමාන්‍යාධිකාරී වෙත පැමිණිලිකරුගේ ගැටළුව පිළිබඳව ලිඛිතව දැන්වීමෙන් පසුව එකී සාමාන්‍යාධිකාරීවරයා විසින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පිරිස්) වෙත පැමිණිලිකරු වෙත ලබාදී ඇති පත්වීම් ලිපිය නිවැරදි කරන ලෙසට උපදෙස් ලබාදී ඇති බවත්.

- ඉන් අනතුරුව එකී නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයා විසින් මෙම කාරණාව පිළිබඳව ප්‍රධාන ඉංජිනේරු (ප්‍රතිපත්ති) සහ මානව සම්පත් කළමණාකරු වෙතින් වාර්තා කැඳවා ඇති අතර එකී ප්‍රධාන ඉංජිනේරු (ප්‍රතිපත්ති) විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවේ නිර්දේශ කර ඇත්තේ කළමනාකරු (විමර්ශන) තනතුරට අදාළ අනුමත සුදුසුකම 2008.03.31 දිනැති මණ්ඩලීය පත්‍රිකාවේ සඳහන් මණ්ඩලීය අනුමැතිය ඇති සුදුසුකම් බව තවදුරටත් තහවුරු කරමින් මෙම පැමිණිලිකරු කළමනාකරු (විමර්ශන) තනතුරට තෝරා ගෙන ඇත්තේ එකී සුදුසුකමට අනුව නම් අදාළ දින සිට K2/S2 වැටුප් පරිමානය ලබා දෙන ලෙස බව නිරීක්ෂණය වේ.

- එසේම මානව සම්පත් කළමනාකරු වෙතින්ද කැඳවන ලද 2022-01-10 දිනැති වාර්තාවේදී ද සඳහන් වී ඇත්තේ "If Mr. H.J.I Fernando has been granted the Manager (Investigation) Post, he would have been given S2/K2 (Cl II Gr I) salary scale from the appointment date" යනුවෙන් බැවින් එම නිලධාරීන් දෙදෙනා විසින්ම පැමිණිලිකරුගේ පත්වීම නිවැරදි කිරීමට අදාළ නිර්දේශයක් ලබාදී ඇති බවට නිරීක්ෂණය වේ.

- එසේ තිබියදී මාස 8 කට ආසන්න කාලයක් එකී උපදෙස් පරිදි කටයුතු නොකළ අතර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පිරිස්) විසින් මෙම පැමිණිලිකරු වෙත දන්වා ඇත්තේ ඔහු විසින් ඉල්ලා සිටින පන්තිය හා ශ්‍රේණිය ලබා දියනොහැකි නමුත් එකී තනතුර 11 පන්තිය 11 ශ්‍රේණියේ K2 වැටුප් පරිමානයට නිවැරදි කර ලබා දෙන බවයි. නමුත් වගඋත්තරකාර ආයතනයේ කළමනාකරු (විමර්ශන) යන තනතුර එම ආයතනයේ මණ්ඩලීය අනුමත බඳවා ගැනීම් හා උසස් කිරීම් පටිපාටිය අනුව 11 පන්තිය 1 ශ්‍රේණිය වන බැවින් එකී නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පිරිස්) විසින් එකී පටිපාටියට පටහැනිව හා ඔහු සතු බලය අවභාවිතා කරමින් ඉහත කී පටිපාටියේ නොමැති පන්තියක් හා ශ්‍රේණියක් හඳුන්වා දීමට උත්සාහයක් දරා ඇති බවට නිරීක්ෂණය වේ.

- ඒ අනුව වගඋත්තරකාර ආයතනය විසින් පැමිණිලිකරුගේ පත්වීම සම්බන්ධයෙන් සිදුවී ඇති දෝෂය නිවැරදි කරන ලෙසට නිර්දේශ කර තිබියදී එය නොසළකා කටයුතු කරමින් පැමිණිලිකරු K 3 වැටුප් තලයේ පිහිටුවා ඇති නිලධාරියෙකු ලෙස සළකා, එකී පටිපාටියේ උසස්වීමක් ලබා ගැනීමේදී අනුගමනය කළ යුතු විධිවිධානයන් මෙම පැමිණිලිකරු විසින් සම්පූර්ණ කිරීම අවශ්‍ය බවට සඳහන් කරමින් එනම් පූර්ණ වෘත්තීය සුදුසුකම් නොමැතිව K 2 වැටුප් තලය සහ 11 පන්තියේ 1 ශ්‍රේණියේ පැමිණිලිකරුව පිහිටුවීමට නොහැකි බවට සඳහන් කරමින් ඔහුගේ ඉල්ලීම මෙතෙක් සපුරා නොදී

අවුරුදු 9 ක කාලයක් ගත කිරීම තුළින් ද මෙම පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වී ඇති බවට තවදුරටත් නිරීක්ෂණය වේ.

- තවද කළමණාකරු (විමර්ශන) තනතුර සඳහා 2016.04.01 දිනැති අභ්‍යන්තර දැන්වීම අනුව අයදුම්පත් කැඳවීමේදී පහත සඳහන් නිර්නායක මූලික වශයෙන්ම සැලකිල්ලට ගෙන ඇති බවට නිරීක්ෂණය වේ.

  I. ගිණුම් හා විගණන සේවයට අනුයුක්තව සිටින,
  II. K 3 වැටුප් තලයේ සේවය ස්ථිර වූ
  III. අවම වසර 7 ක විගණන හා විමර්ශන ක්ෂේත්‍රයේ පළපුරුද්ද ඇති ලංචිම නිලධාරියෙකු විය යුතු ය.

- එබැවින් කළමණාකරු (විමර්ශන) තනතුර සඳහා අයදුම් පත්‍ර ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන ලද ලංචිම නිලධාරියෙකු අනිවාර්යයෙන්ම K 3 වැටුප් තලයේ ස්ථිර වී තිබිය යුතු බවට නිරීක්ෂණය වේ.

- එසේ K 3 වැටුප් තලයේ ස්ථිර වූ නිලධාරියෙකු එහි වසර 7ක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසු ඉහත කී තනතුර සඳහා පත්වීමක් ලබාදීමේදී ඒ සඳහා සළකා බලන ලද K 3 වැටුප් තලයට වඩා ඉහළ වැටුප් තලයක් තෝරා පත් කර ගන්නා ලද තනතුරට ලබා දියයුතු බවට කරුණු පැහැදිලි වේ.

- එබැවින් ඉහත පැමිණිලිකරු කළමණාකරු (විමර්ශන) තනතුර සඳහා තෝරා පත් කර ගැනීමට ප්‍රථමව K 3 වැටුප් තලයේ ස්ථිර වූ නිලධාරියෙකු බවට තහවුරු වන හෙයින් ඉන් අනතුරුව එය පදනම්ව ලබා දෙන ලද කළමණාකරු (විමර්ශන) තනතුර නැවත වරක් K 3 වැටුප් තලයේ ලබාදීම අවිධිමත් ක්‍රියාවලියක් වන අතර එය K 2 වැටුප් තලයේ වගඋත්තරකාර ආයතනයට අදාළ අනුමත බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය ප්‍රකාරව 11 පන්තිය 1 ශ්‍රේණිය වියයුතු බවට වඩා පැහැදිලි වේ.

- මෙම පැමිණිලිකරු වෙත 2016.07.08 දින ලබා දෙන ලද කළමණාකරු (විමර්ශන) තනතුර ලංචිමට අදාළ අනුමත බඳවා ගැනීම් හා උසස්කිරීමේ පටිපාටියට අනුකූලව 11 පන්තිය 1 ශ්‍රේණිය ලෙස විධිමත් ලෙස ලබාදී තිබුණේ නම් එම ශ්‍රේණියේ අවුරුදු 6 ක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් වෙත එම තනතුරට අදාළව උසස් කිරීමේදී කළමණාකරු (විමර්ශන) 1 පන්තිය සඳහා 2022 වර්ෂයේදී මෙම පැමිණිලිකරු වෙතද එකී උසස්වීම ලබා ගැනීමට අවස්ථාවක් පැවතුණු බවද තවදුරටත් නිරීක්ෂණය වේ.

- මෙම පැමිණිලිකරුගේ අනෙකුත් මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වී ඇති බවට සඳහන් කර ඇති පැමිණිල්ල පූර්ණ වෘත්තීය සුදුසුකම් දීමනාව කළමනාකාර (විමර්ශන) තනතුර සඳහා ලබා ගැනීම සම්බන්ධව වන නමුත් වෘත්තිමය සුදුසුකම් සළකා බලා ඊට අදාළ දීමනාවන් පිළිබඳව කටයුතු කිරීමට හැකියාව පවතින්නේ කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ලබා දෙනු ලබන උපදෙස් පරිදි වන බැවින් එම කාරණාව පිළිබඳව නිගමනයකට එළඹීමට කොමිෂන් සභාව අදහස් නොකරයි.

**නිගමනය**

ඉහත නිරීක්ෂණයන් සියල්ල සළකා බැලීමේදී ලංකා විදුලිබල මණ්ඩලය තුළ පවතින අනුමත බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය උල්ලංඝණය කරමින් පැමිණිලිකරු වෙත 2016.07.08 දින ලබා දී ඇති පත්වීම් ලිපිය අනුව ඉහත වගඋත්තරකරුගේ ක්‍රියාකළාපය හේතුවෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) ව්‍යවස්ථාව මගින් තහවුරු කර ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වී ඇති බවට නිගමනය කෙරේ.

**නිර්දේශය**

පැමිණිලිකරු වෙත K 2 වැටුප් තලයේ 11 පන්තිය 1 ශ්‍රේණියට අයත් වැටුප් තලය 2016 සිට ලබාදී ඇති අතර ඊට අනුරූපව අදාළ ශ්‍රේණිය ස්ථානගත කිරීම සිදු කර නොමැත. එහෙයින් ඉහත පැමිණිලිකරු වෙත 2016.07.08 දින නිකුත් කර ඇති පත්වීම් ලිපිය, එදින සිට බලපැවැත්වෙන පරිදි පැමිණිලිකරුගේ පත්වීම K 2 වැටුප් තලය සහ 11 පන්තියේ 1 ශ්‍රේණියට අයත් වන පරිදි සංශෝධනය කර නිකුත් කළ යුතු අතර ඊට අදාළව ආයතනයේ පවතින අනුමත බඳවා ගැනීම් හා උසස් කිරීමේ පටිපාටිය අනුව හිමිකම් ලබන ශ්‍රේණිගත උසස්වීම් ද ලබා දිය යුතු ය.

2025. නොවැ. 04 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරු වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද කොමිෂන් සභාවට දැනුම් දියයුතු වන අතර එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සළකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී. දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත : ඉංජිනේරු කුමාර ජයකොඩි මහතා,
අමාත්‍යතුමා,
බලශක්ති අමාත්‍යාංශය,
437, ගාලු පාර.
කොළඹ 03.